සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

# ඉස්ලාම් ධර්මය

**9 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

## I - කොටස

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 'අර්රහ්මාන්' යන පදයේ තේරුම

(i) අසීමිත කරුණාවන්තයා (ii) මැවුම්කරුවා

(iii) අසම දයාවන්තයා (iv) කෑම ලබාදෙන්නා

02 රත්තරන්වල සකාත් වාජිබ් වීමට තිබිය යුතු අවම ප්‍රමාණය

(i) ග්‍රෑම් 65 (ii) ග්‍රෑම් 74 (iii) ග්‍රෑම් 96 (iv) ග්‍රෑම් 85

03 'හිසාබ්' යන පදයෙන් අදහස් කරන්නේ,

(i) ස්වර්ගය (ii) අපාය (iii) විභාගය කිරීම (iv) කබ්රය

04 ඉද්රීස් (අලෛ) තුමාට පහළ කළ සුහුෆු ගණන,

(i) 30 (ii) 20 (iii) 40 (iv) 50

05 'කාතමුන් නබි' යනුවෙන් අමතන විශේෂවන්තයා

(i) මූසා (අලෛ) (ii) නූහ් (අලෛ) (iii) ඊබ්‍රාහිම් (අලෙ) (iv) මුහම්මද් (සල්)

06 'රූහුල්ලාහ්' ලෙස අමතනු ලබන විශේෂවිත්ත නබි

(i) දාවූද් (අලෛ) (ii) සුලෛමාන් (අලෛ)

(iii) ඊසා (අලෛ) (iv) ශීදු (අලෛ)

07 'මීසාන්' යනු

(i) අපායට උඩින් දමා ඇති පාලම (ii) ජලාශයක්

(iii) විචාරනය (iv) තරාදිය

08 අල්ලාහ් තආලාගේ විශේෂ නාම වලින් එකක්

(i) අල් වදූද් (ii) බුක්මුන් (iii) උම්යුන් (iv) මුස්තහීලුන්

09 'සිෆාත්' යන පදයේ තේරුම

(i) නාමය (ii) ගුණාංග (iii) දෙවියා (iv) සලාතය

10 අකීදා කලාවෙහි උගතුන් අස්මාඋල් හුස්නාව කීයකට වර්ග කර තිබේ ද?

(i) 2 (ii) 3 (iii) 4 (iv) 5

11 'ජම්උත් තක්දීම්' යනු

(i) පසුව ඇති සලාතයේ වේලාවට එක්කර සලාතය ඉටුකිරීම.

(ii) ඉදිරිනේ ඇති සලාතයේ වේලාවට එක්කර සලාතය ඉටුකිරීම.

(iii) ඉස්සර කර සලාතය ඉටුකිරීම.

(iv) පසුකර සලාතය ඉටුකිරීම.

12 'කස්ර්' යනු

(i) එක්කිරීම (ii) ඉස්සර කිරීම (iii) පසුකිරීම (iv) කෙටිකිරීම

13 එක්කිරීමෙන් හා කෙටිකිරීමෙන් ඉටුකළ නොහැකි සලාතය

(i) මඃරිබ් (ii) ඉෂා (iii) සුබ්හු (iv) අසර්

14 ජුම්ආ දිනයේ පිළිපැදිය නොයුතු දෙයක් වන්නේ,

(i) පල්ලියට ඇතුළු වූ විට රක්අත් දෙකක් නැමදිම.

(ii) ශුද්ධ වස්ත්‍ර ඇඳීම.

(iii) පල්ලිය තුළ සිටින මිනිසුන් පහුකර යාම.

(iv) ඉමාම්ගේ දේශනාවට සවන්දීම.

15 ආගම් පහළ වූ රසූල්වරුන්ගේ කෙනෙක්

(i) හාරූන් (අලෛ) (ii) යූසුෆ් (අලෛ)

(iii) හූද් (අලෛ) (iv) මුහම්මද් (අලෛ)

16 නබිවරුන්ට තිබිය යුතු ගුණාංග වලින් එකක්

(i) අල්බලාදත් (ii) අත්තක්ලිද් (iii) අස්සිද්ක් (iv) අල් කිද්බ්

17 නබිවරුන්ට තිබිය නොයුතු ගුණාංග වලින් එකක්

(i) අල් කිත්මාන් (ii) අල් පතානත් (iii) අල් අමානත් (iv) අත්තබ්ලිග්

18 එළුවන්ගේ සකාත් වාජිබ් වීමට ආරම්භ ප්‍රමාණය

(i) 30 (ii) 40 (iii) 50 (iv) 60

19 ජනාබත් ඇති අය නොකළ යුතු දෙයක්

(i) කෑම ගැනීම (ii) පානය කිරීම

(iii) සලාම් කීම (iv) නැමදීම (සලාතය ඉටුකිරීම)

20 වුළූවෙහි ෆර්ලු ගණන

(i) 5 (ii) 6 (iii) 7 (iv) 8

- **අංක 21 සිට 25 තෙක් වරහන් තුළ ඇති පදවලින් ගැළපෙන පද තෝරා හිස්තැන් පුරවන්න.**

(දූතභාවය / නැමදීමට සුදුස්සා / මආද් / නැවීමද / සංචාරය කරන අය)

21 ඊමානයෙහි වැදගත් කොටස් වලින් එකක් ................................................................ පිළිබඳ වූ විශ්වාසයයි.

22 රිසාලත් යනු ........................................................................................................................ ලෙස හැඳින්වේ.

23 මරණයට පත්වූ කෙනෙකුට කළයුතු යුතුකම් වලින් ............................................................................ එකකි.

24 ඉබ්නුස්සබීල් ලෙස හඳුන්වන්නෝ ............................................................................................................ වෙති.

25 'ඉලාහ්' යන පදයේ තේරුම ................................................................................................................ කියා ය.

- **අංක 26 - 30 දක්වා ඇති වාක්‍ය හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

26 ජනාසා සලාතයේ සතරවන තක්බීරයෙන් පසු නබි (සල්) තුමාණන්ට සලවාත් කීම. (    )

27 සකාතය පිළිවෙළට දීමෙන් ධනවතුන්ගේ වස්තුවේ දියුණුව ඇතිවේ. (    )

28 'වුජුදුන්' යන ගුණාංගය අල්ලාහ්තආලාට තිබිය නොහැකි ගුණාංගවලින් එකකි. (    )

29 ප්‍රාර්ථනා කිරීමට සුදුස්සා යැයි 'ඉලාහ්' යන පදය හඟවයි. (    )

30 කලාකද්ර් වූ විශ්වාසය 'පෙරමිණුම' ලෙස අමතමු. (    )

- **අංක 31 - 35 දක්වා වු ප්‍රශ්නවලට A කොටසින් ගැළපෙන වැකිය B කොටසට යා කරන්න.**

| | A | | B |
|---|---|---|---|
| 31 | සලාතය | i. | දේව භක්තිය ඇතිකරයි. |
| 32 | සව්මය | ii. | ලෝබකම තුරන්කරන් |
| 33 | සකාතය | iii. | පරිත්‍යාග චින්තනය මවයි |
| 34 | හජ් | iv. | අපායට |
| 35 | පාප කර්ම | v. | වැරදි ක්‍රියාවලින් වළක්වයි |

- **36 - 40 දක්වා වූ ප්‍රශ්නවලට ගැළපෙන පදය යොදා හිස්තැන් පුරවන්න.**

36 'සකාත්' යන පදය ............................................................................................ යන තේරුම දෙයි.

37 වසක් පහක් යනු ............................................................................................... කිලෝ ග්‍රෑම් වේ.

38 අනිවාර්ය වූ ස්නානයේ දී ........................................................................ ජලය භාවිතා කළ යුතුයි.

39 ඉතා උසස් ස්වර්ගයේ නම ............................................................................................................ වෙයි.

40 මහ්ෂර් පිටියේ ............................................................................................ යන ජලාශය තිබේ.

**9 ශ්‍රේණිය** **ඉස්ලාම් ධර්මය - II කොටස**

- **ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01 (i) අවසන් දිනය හඳුන්වන අරාබි වචන තුනක් සඳහන් කරන්න.

(ii) ස්වර්ගයේ වින්දනය ගැන පවසන කුර්ආන් වැකියක් ලියන්න.

(iii) ස්වර්ගය යනු කුමක්ද කියා පැහැදිලි කරන්න.

(ලකුණු 3 + 6 + 6 = 15)

02 (i) ස්වර්ගයට කියන නම් තුනක් ලියන්න.

(ii) කලාකද්ර්ය විශ්වාස කිරීමෙන් ඇතිවන පිං මොනාවා ද?

(iii) තව්හීද් රුබූබියියා ගැන විස්තර කරන්න.

(ලකුණු 3 + 6 + 6 = 15)

06 (i) සාමාන්‍ය නජිසයට උදාහරණ තුනක් ලියන්න.

(ii) ජනාබතය ඇතිකරන ක්‍රියාවන් දක්වන්න.

(iii) ජනාබත් අය නොකළ යුතු කරුණු විස්තර කරන්න.

(ලකුණු 3 + 6 + 6 = 15)

04 (i) අනිවාර්ය වූ ස්නානයේ ෆර්ලු දෙක ලියන්න.

(ii) සිකුරාදා දිනයේ විශේෂත්වය ගැන පැහැදිලි කරන්න.

(iii) සකාතය වාජිබ් වීමට ඇති කොන්දේසි (ෂර්තයන්) සඳහන් කරන්න.

(ලකුණු 3 + 6 + 6 = 15)

05 (i) (ජාහිලියියා) අඳුරු යුගයේ මිනිස්සු තව්හීදයේ කුමන කොටස පිළිපැද්දෝ ද?

(ii) තව්හීදුල් අස්මායි වස්සිෆාත් යනු කුමක් ද?

(iii) ස්නානය කරන විට පිළිපැදිය යුතු සුන්නත් වූ ක්‍රියාවන් කුමක් ද?

(ලකුණු 3 + 6 + 6 = 15)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) iii (02) iv (03) iii (04) i (05) iv (06) iii (07) iv (08) i (09) ii
(10) iii (11) ii (12) iv (13) iii (14) iii (15) iv (16) iii (17) i
(18) ii (19) iv (20) ii (21) මආද් (22) දූත භාවය (23) ස්නානය කිරීම ද
(24) සංචාරය කරන අය (25) නැමදීමට සූදුස්සා (26) ✗ (27) ✓ (28) ✗ (29) ✓
(30) ✓ (31) v (32) i (33) ii (34) iii (35) iv (36) පවිත්‍රත්වය (37) 675
(38) අති ශුද්ධ වූ ජලය (39) ජන්නතුල් ෆිර්දව්ස් (40) හව්ලුල් කව්සර්

## II කොටස

01 (i) යව්මුල් බඃස් / යව්මුල් හිසාබ් / යව්මුල් කියාමා / යව්මුල් ආඛිරා / යව්මුද්දීන් / යව්මුද්දආෂුන්

(ii) අල්ලාහ් විශ්වාස කර, යහකම් ද කළවුන්ට නියතව ස්වර්ග උයන්හි ඇතුළු කරන්නේ ය. ඒවායෙහි පහළින් ගංගා ගලා බසියි. එහි ඔවුහු රන් වළලුද මුතුද අන්දවනු ලබන්නෝ ය. එහි ඔවුන්ගේ වස්ත්‍රය සේද වේ. (22:23)

(iii) මෙම ලෝකයේ යහකම් කළවුන්ට අවසාන දිනයේ අල්ලාහ් තආලා විසින් දෙනු ලබන ඉතා ප්‍රශංසනීය ස්ථානය ස්වර්ගය වේ. ස්වර්ග රැසක් ඇත. එයින් ඉතා උසස් ස්වර්ගය ජන්නතුල් ෆිර්දව්ස් වේ. ස්වර්ගයේ කිරි. මී පැණි වැනි ගංගා හා ඇස්වලින් නොදුටු කන්වලින් නොඇසූ මනසේ ගොඩනැගූ සැප සම්පත් රාශියක් සම්පූර්ණයෙන් දැකිය හැක.

02 (i) ජන්නතුල් ෆිර්දව්ස්, ජන්නතුල් මඃවා, ජන්නතුල් අද්න්, දාරුල් හුලුත්, දාරුල් සලාම්, දාරුල් මුකාමා, ජන්නතුල් නඊම්

(ii) අල්ලාහ් තආලා දී ඇති දේවල්වලින් තෘප්තියක් ලබා ජීවත් වීමට මග පාදයි. / අත්වැඩවල යෙදීමට මග පාදයි. / භයානක අවස්ථාවලදී නිර්භීතව වැඩ කිරීමට හැකිවෙයි. / පවට විරුද්ධවීමේ හැකියාව තිබේ. / දුක්බර, වේදනාබර අවස්ථාවලදී ඉවසීමෙන් කටයුතු කිරීමට හැකිවීම.

(iii) රුබූබියියත්

'රබ්' යන වචනයෙන් මතුවීම / ලොව මැවුම්කරුවා වූ අල්ලාහ්ව භාරගැනීම / පාලනය කිරීම, පෝෂණය කිරීම, ජීවිතය හා මරණය දීම ආදී / ලොව වැඩි පිරිසක් විසින් මෙය පිළිගන්නා ලදී / අඳුරු යුග ජනතාව විසින් මෙය පිළිගන්නා ලදී

03 (i) මළ මූත්‍රා, ලේ, සැරව, වමනය යනාදී

(ii) මුස්ලිම්වරයෙකු කාලක්‍රියා කිරීම / අවදියෙන් සිටියදී හෝ නින්දේදී ශුක්‍ර ධාතු පිටවීම / ස්ත්‍රී පුරුෂ සංසර්ගයේ යෙදීම / හයිල් සිදුවීම / නිෆාස් සිදුවීම

(iii) නැමදීම / සලාතය කිරීම / තවාෆ් කිරීම / අල්කුර්ආනය ඇල්ලීම / ඉසිලීම / පරායණා කිරීම / මස්ජිදයේ රැඳීම හා ඇතුල්වීම

04 (i) ෆර්ලු වූ ස්නානය ඉටුකරමි යැයි නියියත් තැබීම / මුළු ශරීරයම ජලයෙන් සේදීම

(ii) සිකුරාදා දිනයේ ආදම් නබි මවන ලදී / සිකුරාදා දිනයක ආදම් නබි අභාවප්‍රාප්ත විය / සිකුරාදා දින ලෝක අවසාන දිනය ඇතිවෙයි / සිකුරාදා දින මිනිසුන් විභාග කිරීම සඳහා නැගිට්ටුවන්නෝය / සිකුරාදා දින මුහම්මද් නබි තුමා වෙනුවෙන් පවසන ලද සලවාතත් එතුමාට පෙන්නුම් කරනු ලැබේ

(iii) සකාත් අනිවාර්ය වීමේ කොන්දේසි

මුස්ලිම්වරයෙකු විය යුතුය / නිදහස් මිනිසෙකු විය යුතුය / වස්තුව තමා සතු විය යුතුය / වස්තුව නියමිත ප්‍රමාණයෙන් තිබිය යුතුය / කාලච්ඡේදය සම්පූර්ණ විය යුතුය / මූලික අවශ්‍යතාව වැඩිපුර තිබිය යුතුය

05 (i) තව්හීදුල් රුබූබියියා

(ii) අල්ලාහ් තආලාගේ ගුණාංග, විශේෂ නාමයන්, ඔහු කියාදී තිබෙන පරිදි විශ්වාස කළ යුතුය

(iii) ස්නානයට පෙර මූත්‍රා කිරීම / ශරීරයේ තැවරී ඇති අපිරිසිදු දේවල් ඉවත් කිරීම / අත්දෙක මැණික් කටුව තෙක් සේදීම / මුව හා නාස්පුඩුව වතුර ගෙන සේදීම / දත් මැදීම / වුළුඃ කිරීම / මුළු ශරීරයම අතුල්ලා නෑම